# බහු සංස්කෘතික සමාජයක් තුළ සමාජ වෘතවේදියෙකු මුහුණදිය හැකි අභියෝග පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

*එස්.අයි.ආර්. ලියනගේ* [1]

සාර්ථක සමාජ වෘතවේදියෙකු බවට පත්වීමේ ක්‍රියාවලියෙහි එක් අංශයක් වනුයේ, විවිධ මාදාලියේ අර්බුද හැඳින ගන්නා අන්දම ඉගෙනීම සහ සේවාලාභියාගේ ලෝක දෘෂ්ටියට ගැළපෙන අයුරින් තම කාර්යය හැඩගස්වා ගැනීම ය. සමාජ විද්‍යාවට අනුව බහු සංස්කෘතිකවාදය යනු කිසියම් සමාජයක් සංස්කෘතික විවිධත්වයට අදාළ ව කටයුතු කරන ආකාරය වේ. මෙවැනි බහු සංස්කෘතික රාමුවක් තුළ සමාජ වෘතවේදියෙකු ලෙස කටයුතු කිරීමේ දී විවිධ ජනවාර්ගිකයන් හා සංස්කෘතික කණ්ඩායම් අතර පවතින අසමතුලිත සමාජ චර්යාවන් හේතුවෙන් මුහුණ දීමට සිදු වන අභියෝග හා කාර්යය ඉතා සංකීර්ණ වේ. මෙම පර්යේෂණයෙහි ගැටලුව වනුයේ බහු සංස්කෘතික සමාජයක් තුළ සමාජ වෘතවේදියෙකු මුහුණ දිය හැකි අභියෝග මොනවා ද යන්න අධ්‍යයනය කිරීම වේ. මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වනුයේ බහු සංස්කෘතික සමාජයක් තුළ සමාජ වෘතවේදියෙකු මුහුණ දිය හැකි අභියෝග හඳුනා ගැනීම වන අතර උපඅරමුණ ලෙස ඵලදායී සමාජ වෘතවේදියෙකු වසයෙන් එම අභියෝග නිරාකරණය කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම දැක්විය හැකි ය. මෙහි දී පර්යේෂණයට අදාළ දත්ත ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව ද්විතීයික මූලාශ්‍රය ඇසුරින් ලබා ගැනිණි. එම ද්විතීයික මූලාශ්‍රය ලෙස ග්‍රන්ථ, පර්යේෂණ ලිපි, පුවත්පත්, වාර්තා චිත්‍රපට, අන්තර්ජාල තොරතුරු ලබාගත් අතර සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් විශ්ලේෂණය කරමින් නිගමනයන්ට එළඹිණි. මෙම අධ්‍යයනය තුළින් බහු සංස්කෘතික සමාජයක් තුළ සමාජ වෘතවේදියෙකු මුහුණ දෙන ප්‍රධාන අභියෝග ලෙස, සංස්කෘතික සම්මතයන්ගෙන් ඔබ්බට ගොස් මැදිහත්වීමට නොහැකි වීම, වාසස්ථානයෙහි පිහිටීම හා භාෂා විෂමතා, පුම්තිරිභාවය, ආර්ථික පංති පසුබිම, සංස්කෘතික ගැටුම්, කාලානුක්‍රම සංවර්ධන අභියෝග, වෙන් කොට සැලකීම හා ඵලදායී ඒකාබද්ධ ප්‍රතිපත්ති සඳහා වන අවශ්‍යතාව යනාදිය හඳුනාගත හැකි විය. බහු සංස්කෘතික සමාජයක් තුළ කටයුතු කිරීමේ දී සමාජ වෘතවේදීන් විසින් සේවාලාභියාගේ වටිනාකම් හා පක්ෂග්‍රාහීත්වය පිළිබඳ දැනුවත් වීම, සේවාදායකයාගේ ලෝක දැක්ම පිළිබඳ දැනුවත් වීම, සංස්කෘතික වසයෙන් සුදුසු මැදිහත්වීම් සිදු කරයි. එමෙන් ම බහු සංස්කෘතික සමාජයක් තුළ ඵලදායී සමාජ වෘතවේදියෙකු වසයෙන් කටයුතු කිරීම සඳහා, දැනුම, කුසලතා සහ මැදිහත්වීමේ ක්‍රමෝපාය, විශ්වාස සහ ආකල්ප, සංස්කෘතිය සංයෝජනය කිරීම, සංස්කෘතික නිපුණතාව, සංවේදනය සහ සංස්කෘතීන් වෙන් කර හඳුනා ගැනීම වැනි ගුණාංග වර්ධනය කරගත යුතු බව අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි විය. ඒ අනුව, බහු සංස්කෘතික සමාජයක් තුළ සමාජ වෘතවේදියෙකු ලෙස කටයුතු කිරීමේ දී පුද්ගලයා, පවුල, ප්‍රජාව සහ සමස්ත සමාජයේ ම අවශ්‍යතා සඳහා වන ආකල්ප තක්සේරු කරමින් ඒවාට සංවේදී වෙමින් බහු සංස්කෘතික සමාජ සුභසාධන ක්‍රියාකාරියෙකු ලෙස පරිවර්තනය විය යුතු බවට නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** බහු සංස්කෘතික සමාජය, සමාජ වෘතවේදය, අභියෝග, ජනවාර්ගිකත්වය

[1] සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. sandalil525@gmail.com